NATIONS UNIES
DROITS DE L'HOMME
HAUT-COMMISSARIAT

UNITED NATIONS
HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

HAUT-COMMISSARIAT AUX DROITS DE L'HOMME • OFFICE OF THE HIGH COMMISSIONER FOR HUMAN RIGHTS
PALAIS DES NATIONS • 1211 GENEVA 10, SWITZERLAND
www.ohchr.org • TEL: +41 22 917 9000 • FAX: +41 22 917 9008 • E-MAIL: registry@ohchr.org

# මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ (**OHCHR**) ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය

<u>**විශය ක්ෂේත්‍රය**</u>

## 1. විධි නියෝගය සහ වාර්තා කිරීමේ වගකීම්

2014 මාර්තුවේ දී සම්මත කරන ලද "ශ්‍රී ලංකාවෙහි සංහිදියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම" නම් A/HRC/25/1 යෝජනාව මගින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයට "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමෙන් ආවරණය කරන ලද කාලය තුල දෙපාර්ශයෙන්ම සිදුවී ඇතැයි කියන බරපතල මානව හිමිකම් කඩවීම් සහ අපහරණ හා ඒ ආශ්‍රිත අපරාධ පිළිබඳව, විශේෂ ක්‍රියාමාර්ග සඳහා බලය පැවැරී ඇති පාර්ශව සහ අදාළ විද්වතුන්ගේ සහාය ඇතිව, පුළුල් පරීක්ෂණයක් කිරිමට බාර ගන්නා ලෙසත් එහිදී දණ්ඩ මුක්තිය වැළැක්වීම හා වගවීම සහතික කරනු සඳහා සිදුවි ඇතැයි කියන මෙම උල්ලංඝනයන් සහ අපරාධයන්ට අදාළ සිදුවීම්වලට අදාළ කරුණු හා සිද්ධින් නිර්ණය කරන ලෙසත්" නිර්දේශ කළා ය.

කවුන්සිලය එහි විසි හත්වන සැසිවාරයෙහි දී  දී වාචික යාවත්කාලීන කිරීමක් ඉදිරිපත් කරන ලෙසත් එහි විසි අටවන සැසිවාරයට පරීක්ෂණය පිළිබඳව සර්ව සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් මහ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටියා ය.

මෙකී විධි නියෝගයට යටත්ව මානව හිමිකම් පිළිබඳ මානව හිමිකම් එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) ජිනීවාහි පිහිටුවන ලදී.

## 2. කාල රාමුව

පරික්ෂනයට බඳුන් වන කාලය උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කමිටුව විසින් ආවරණයකළ කාලය යි. එනම් 2002 පෙබරවාරි 21 දා සිට එය සිය වාර්තාව ජනාධිපතිවරයාට පිළිගැන්වූ 2011 නොවැම්බර් 15 දා දක්වා ය. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL),  මෙම කාල රාමුවට පිටතින් වන එනමුත් සිදුවීම් තේරුම් ගැනීමට උපකාරක වන හෝ අඛන්ඩව කැරෙන මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් අදාළ වන්නාවූ සන්දර්භානුගත සහ අනෙක් උචිත තොරතුරු ද සැලකිල්ළට ගන්නවා ඇත.

**3. නෛතික රාමුව**

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්‍යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයෙහි (OISL) විධි නියෝගය විසින් එයට දෙපාර්ශවය විසින්ම කරන ලදැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් සහ අපහරණයන් සහ අදාළ අපරාධයන් පරීක්ෂා කිරීමට පැවැරේ.

පරීක්ෂණය රදා පවත්නා නෛතික රාමුවට, අන්තර් ජාතික මානව හිමිකම් ගිවිසුම් යටතෙහි ශ්‍රී ලංකාව පිළිගෙන ඇත්තාවූ ද සහ ව්‍යවහාරික අන්තර් ජාතික නීතිය යටතෙහි අදාළ වන්නා වූ ද සියලු බැඳීම් අයත් වනවා ඇත. රාජ්‍යමය නොවන පාර්ශවයන්ට නියමානුකූලව මානව හිමිකම් ගිවිසුම්හි කොටස්කරුවන් විය නොහැකි වුවද රාජ්‍යයක භූමි පුදේශයක් මත තත්වාකාරයෙන් පාලනයක් පවත්වා ගෙන යන්නාවූ රාජ්‍යමය නොවන කන්ඩායම් එම භූමි ප්‍රදේශයෙහි වාසය කරන්නාවූ පුද්ගලයින් සම්බන්ධයෙන් නිශ්චිත මානව හිමිකම් ගරුකළ යුතු බවට වර්ධනය වන පිළිගැනීමක් වත්මනෙහි පවතී.

පරීක්ෂණය විසින් ආවරණය කැරෙන කාල පරිච්ජේදයෙහි අභ්‍යන්තර සන්නද්ධ ගැටුමක් පැවතුනි. එම කාරණය විසින් ගැටුම තුළ ආන්ඩුවේ මෙන්ම රාජ්‍යමය නොව සන්නද්ධ කණ්ඩායම්හි හැසිරීම මැනබැලීම පිනිස අන්තර් ජාතික මානුෂීය නීතිය , විශේෂයෙන් ම ජිනීවා ප්‍රඥප්තියෙහි එන අන්තර් ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධ විධි විධාන ආදේශ කිරීම අත්‍යවශය කෙරෙයි. එනයින් නෛතික රාමුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම යොදා ගත් රාමුවම ය. එහි විධි නියෝගය විසින් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්‍යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයට (OISL) බඳුන් වන කරුණු සහ සිදුවීම් අරභයා, අපරාධ සිදු කොට ඇත්තේදැයි නිර්නය කරනු පිණිස, අන්තර් ජාතික අපරාධ නීතිය ආදේශ කිරීම අවශ්‍ය කැරෙයි.

**4. විශේෂඥයින්**

2004 ජූනි මාසයෙහිදී මහ කොමසාරිස්වරිය පින්ලන්තයේ හිටපු ජනාධිපති මර්තා අර්තිසාරි මහතා, නවසීලන්තයේ හිටපු මහාධිකරණ විනිසුරුවරියක වන සිලිවියා කාට්රයිට් මහත්මිය සහ පකිස්ථානයේ මානව හිමිකම් කොමිසමෙහි හිටපු සභාපතිනියක වන අස්මා ජහින්ගිර් මහත්මිය යන කීර්තිධර විශේෂඥයින් තිදෙනා සහායක සහ උපදේශාත්මක කාර්‍ය භාරයක් පිණිස මෙන්ම සමස්ත පරීක්ෂන කාලය පුරා ස්වාධීන සත්‍යාන්වේෂනය උදෙසා ද පත් කළාය.

කවුන්සිලයේ යෝජනාව විසින් කියා සිටින පරිදි මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්‍යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) විසින් බහිර්නීතික ඝාතන, අභ්‍යන්තරව විතැන් වූ පුද්ගලයින්, අත්තනෝමතික රඳවා තැබීම්, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචන්ඩත්වය සහ වධහිංසා පැමිණවීම ඇතුලුව එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියාමාර්ග සඳහා බලය පැවැරී ඇති පාර්ශවයන්හි සහාය ද ලබා ගන්නවා ඇත.

**5. ක්‍රියාකාරිත්ව මාදිලියන්**

දෙපාර්ශවයම විසින් කරන ලදැයි කියන උල්ලංඝනයන්, අපහරණයන් සහ අපරාධයන් සම්බන්ධ කරුණු සහ තත්වයන් පිහිටුවා ගැනීම පිණිස මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය විසින් දැනටමත් පවත්නා, ආන්ඩුවේ සහ සිවිල් සමාජ වාර්තාද ඇතුලුව, ලියැවිලි සහ තොරතුරු විමර්ශනය කරනු ඇති අතර වින්දිතයින්ගේ සාක්ෂි, දිවි ගලවා ගත්තවුන්ගේ, සාක්ෂිකරුවන්ගේ සහ අපරාධකරුවන්යැයි කියන පුද්ගලයින්ගේ ආඛ්‍යාන රුස් කරනු ඇත. එමෙන්ම චන්ද්‍රිකා ජායාරූප, සහතික කළ වීඩියෝ හා ජායාරූප සහ නිල ලියැවිලි මගින් ද එය තොරතුරු රුස්කර ගන්නවා ඇත. එක්රුස් කර ගන්නා තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී එය කරුණු සහ සාක්ෂි, තීරණය කර ඇති සනාථ කිරිමේ ප්‍රමිතියට අනුකූල බවට තහවුරු කර ගන්නවා ඇත.( පහත බලන්න)

කවුන්සිලයේ යෝජනාව විසින් අපේක්ෂා කරන ලද පරිදි එය ශ්‍රී ලංකාවේ ආන්ඩුව සමඟ කටයුතු කිරීමට දිගටම උත්සාහ ගන්නවා ඇත. ශ්‍රී ලංකා ආන්ඩුවේ නිලධාරීන් සහ අනෙක් අය හමුවීම පිණිසත් අදාළ සියලු ලියැවිලි පරීක්ෂා කර බැලීම පිණිසත්, මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩ සළසන ලෙස මහ කොමසාරිස්වරයා අඛන්ඩව ඉල්ලා සිටිනවා ඇත.

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL), විශේෂිත නියෝජිතායතන, උනන්දුමත් ආයතන, ශාස්ත්‍රඥයින්, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධාන ද ඇතුලුව ද ඇතුලුව එක්සත් ජාතීන්ගේ ආයතන සමඟ නිත්‍ය සංවාදයක් සහ සහයෝගයක් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කරයි.

ඕනෑම රාජ්‍යකට, පුද්ගලයකුට හෝ සංවිධානයකට මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයට (OISL) ලිඛිතව තොරතුරු දැන්විය හැක. මෙම වෙබ් ලිපිනයේ දැක්වෙන පරිදි තොරතුරු oisl_submissions@ohchr.org යන විද්‍යුත් ලිපිනයට එවිය හැකි ය.

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) සියලුම අවස්ථාවන්හිදී ස්වාධීනත්වය,අපක්ෂපාතිත්වය, විශයමූලික්වය, පාරදෘශ්‍යභාවය, ඒකාග්‍රතාවය සහ ' පීඩාවක් නොකිරීම' (do no harm) යන ප්‍රතිපත්ති ගුරු කොට ගන්නවා ඇත.

**6. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම**

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) සාක්ෂිකරුවන් සහ වින්දිතයින්ගේ ආරක්ෂා කිරීම පිළිබඳ ඇති සැළකිල්ල ආමන්ත්‍රණය කිරීමට යෝගය පියවර ගනු ඇති අතර එහි ක්‍රියාකාරිත්වයේ සියලුම අදියරයන්හිදී එවැනි පුද්ගලයින් ආරක්ෂා කිරීම අරමුණු කරගත් කාර්ය පටිපාටීන් සහ වැඩ මාදිලියන් යොදා ගන්නවා ඇත.

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) හා සම්බන්ධ වන වින්දිතයින් සහ සාක්ෂිකරුවන් මෙන්ම අනෙක් අයවලුන්ද ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාවේ ආන්ඩුවට වගකීමක් ඇති අතර එවැනි කිසිවකු ඉහත කී අකාරයේ සම්බන්ධවීමක් නිසා කිසිදු හිරිහැරයකට, තර්ජනයකට, බිය ගැන්වීමේ ක්‍රියාවකට, අයුතු සැළකීමකට හෝ පළිගැනීමකට හෝ ලක් නොවන බවට ශපථ කරන සේ ශ්‍රී ලංකා ආන්ඩුවෙන් ඉල්ලා සිටිනවා ඇත.

## 7. තොරතුරු රහස්‍යභාවය

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) තොරතුරු රහස්‍යභාවය රැකගැනීම පිණිස, සුදුසු පරිදි එහි ප්‍රසිද්ධ වාර්තාවන්හි පුද්ගල නාම සඳහන් නොකිරීම ද ඇතුලුව, අවශ්‍ය සියලුම පියවරයන් සහ පූර්වාරක්ෂාවන් ගන්නවා ඇත. සිය කාරිය අවසානයේ දී මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) එහි සියලුම රහස්‍ය තොරතුරු, රහස්‍ය තොරතුරු සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රමිතිගත ක්‍රියාපටිපාටීන්ට අනුව ලේඛනාගාර ගත කරනු ඇත.

## 8. සනාථකිරීමේ ප්‍රමිතිය

එක්සත් ජාතින්ගේ කරුණු ගවේෂන ආයතනයන්හි භාවිතාවන්ට අනුකූලව මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) එහි සොයා ගැනීම් "විශ්වාශ කිරීමට ප්‍රමාණවත් හේතු" යන සනාථකිරීමේ ප්‍රමිතිය මත පදනම් කරනවා ඇත. එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) විසින් විශාවාසදායක තොරතුරු සමූහයක් ලබාගෙන ඇත්නම්ද එම තොරතුරු අනෙක් තොරතුරු සමඟ, එය සිදුව ඇති බව පෙන්නුම් කරමින්, ගැලපෙන්නේ නම්ද සිදුවීමක් හෝ උල්ලංඝනයන්හි රටාවක් හෝ අපරාධයක් සිදුව ඇතැයි විශ්වාශ කිරීමට ප්‍රමාණවත් හේතු තිබේ. මෙම සනාථ කිරීමේ ප්‍රමිතිය අන්තර් ජාතික මානුෂීය සහ මානව හිමිකම් නීතිය කෙළෙසීම් සම්බන්ධයෙන් අධිකරණමය පරීක්ෂණයක් ඉල්ලා සිටීමට තරම් ප්‍රමාණවත් ඉහළ මට්ටමක පවතිනු ඇත.

උල්ලංඝනයන්ට සම්බන්ධ වූයේ යැයි පුද්ගලයින් හඳුනා ගැනෙන තොරතුරු තක්සේරු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) තහවුරු කරන ලද අනෙක් තත්වයන් සමඟ ගැලපෙන්නා වූ, එනම් පුද්ගලයකු අපරාධයක් සිදුකිරීමට නියෝග කිරීමට සම්බන්ධයැයි සාධාරණ ලෙස සැක කළ හැකි, විශ්වසනීය තොරතුරු සමුදායක් අවශ්‍ය ය යන ප්‍රමිතියට අනුව කටයුතු කරනවා ඇත. එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) අපරාධ වරදකාරීත්වය සම්බන්ධයෙන් අවසාන තීරණයන්ට නොඑලඹෙනු ඇති අතර එය විසින් කරනු ඇත්තේ සැකකරුවන් විය හැකි පුද්ගලයින් සම්බන්ධයෙන් ඉදිරි අපරාධ පරීක්ෂණයකට මඟ පෙන්වනු ඇති තක්සේරුවක් කිරීමය.

## 9. ශ්‍රී ලංකාවේ ආන්ඩුව සමඟ සහයෝගිතාවය

සිය යෝජනාව මගින් කවුන්සිලය එම යෝජනාව ක්‍රියාවට නැංවීම පිණිස එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගීව කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා ආන්ඩුවෙන් ඉල්ලා සිටියාය. භූමියේ සෑම තැනකටම ගමන් කිරීමේ නිදහස, සියලුම ස්ථානයන්ට සහ ආයතනයන්ට බාධාවකින් තොරව ඇතුල්වීම, ජාතික සහ ප්‍රාදේශීය නියෝජිතයින් මෙන්ම යුද්ධ බලධාරීන්, ප්‍රජා නායකයින්, රාජ්‍ය නොවන සංවිධාන, සහ වෙනත් ආයතනයන් මෙන්ම එහි විධි නියෝගය සම්පූර්ණ කිරීම පිණිස අත්‍යාවශයයැයි සැලකෙන සාක්ෂියක් සහිත පුද්ගලයකු හමුවී සම්මුඛ සාකච්ජා පැවැත්වීමේ නිදහස, වාර්තාගත තොරතුරු මෙන්ම ද්‍රව්‍යමය සාක්ෂි ඇතුලුව සියලුම තොරතුරු මූලාශ්‍රයන් කරා පිවිසීමේ නිදහස එවැනි සහයෝගිතාවයක් විසින් අදහස් කෙරේ.

එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) විසින් වින්දිතයින්, සාක්ෂිකරුවන් සහ මූලාශ්‍රයන් විමසනු සහ තොරතුරු එක්රැස් කරගනු ඇති වෙනත් රටවල ආන්ඩු කෙරෙන්ද එම කොන්දේසි යටතේ පරීක්ෂණය සමඟ සහයෝගී වන්නැයි ආරාධනා කැරේ.

**10.** **වරප්‍රසාද, මුක්තිය සහ පහසුකම්**

එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයේ (OISL) විශේෂඥයින්ට එක්සත් ජාතීන්හි වරප්‍රසාද සහ මුක්තිය පිළිබද 1948 ප්‍රඥාප්තියෙහි IV වගන්තිය යටතෙහි සඳහන් වරප්‍රසාද සහ මුක්තිය හිමිවනු ඇති අතර එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයෙහි (OISL) කාර්ය මණ්ඩලය, ප්‍රඥාප්තියෙහි එන පරීක්ෂනය පවත්වාගෙන යෑමේ V වන සහ VII වන වගන්ති යටතෙහි සඳහන් නිලධාරී වරප්‍රසාද සහ මුක්තිය භුක්ති විදිනු ඇත. මෙම වගකීම පිළිබඳව සියලු ආන්ඩුවලට සිහිපත් කරමින් පරීක්ෂණය ස්වාධීනව කරගෙන යාම සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සහතික කරන ලෙස ආරාධනය කැරේ.

---